# දරුවන් උදෙසා බයිබලයක්



# ළිඳ ළඟ වුන් කාන්තාව

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Lazarus
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ජේසුස් වහන්සේ සහ ඔහුගේ ගෝලයෝ සමාරිය දේශය හරහා ගමන් කරමින් සිටියෝය. ඔව්හු සිකාර් නම් නගරයට පැමිණියෝය.



සිකාර්හි වැසියෝ බීමට ගන්නා ජලය ඇදගත් ළිඳක් එහි විය. එය ඉශ්රායෙල්වරුන්ගේ පියා වන යාකොබ් බොහෝ කලකට පෙර හෑරූ ළිඳක් විය.



මධයහන වේලාවේ බොහෝ විට සැර අව්ව සහ උණුසුම තිබෙන්නට ඇත. ගෝලයන් කෑම මිල දී ගැනීමට සිකාර් නගරයට ගිය අතරතුර ජේසුස් වහන්සේ වෙහෙසට පත්ව ළිඳ ළඟ වාඩි වූ සේක.





ජේසුස් වහන්සේට
තනිව සිටින්නට
සිදුවූයේ වැඩි
වේලාවකට නොවේ.
සිකාර්හි විසූ
කාන්තාවක් වතුර
ඇදීමට පැමිණියාය.
“මට බොන්න දෙන්න”
කියා ජේසුස් වහන්සේ
ඇයට කී සේක.



කාන්තාව පුදුමයට පත්
වූවාය. “යුදෙව්වෙක් වූ
ඔබ සමාරිය ස්ත්‍රියක
වන මගෙන් බීමට
ඉල්ලන්නේ කෙසේද?”
ඇය ඇසුවාය. ඒ දවස්වල
යුදෙව්වන්ට සමාරිය
ජාතිකයන් සමඟ කිසිම
ගනුදෙනුවක් තිබුණේ
නැත.

“මා කවුදැයි ඔබ
දන්නවා නම්, ඔබ
ජීවමාන ජලය
මාගෙන්
ඉල්ලන්නේය”
යනුවෙන් ජේසුස්
වහන්සේ පැවසූ
විට ඇය ඊටත් වඩා
පුදුමයට පත්
වන්නට ඇත.





ඒ ස්ත්‍රිය ජේසුස්
වහන්සේට කතා කොට,
“ස්වාමීනි, ඔබට වතුර අදින්නට
දෙයක්ද නැත, ළිඳද ගැඹුරු ය.
එසේනම්, ජීවමාන ජලය ඔබවහන්සේට
කොයින් ද? ඔබ අපට ළිඳ දුන් අපේ පියා වන
ජාකොබ්ටත් වඩා ශ්‍රේෂ්ඨ දැ” යි ඇසුවාය.



“මේ වතුර බොන
තැනැත්තාට නැවත
පිපාසය ඇති වන්නේයැ”
යි ජේසුස් වහන්සේ
ස්ත්රියට කී සේක.
“නමුත් මා දෙන වතුර
බොන තැනැත්තාට
කිසිදා පිපාසය ඇති
නොවේ. මා දෙන ජලය
ඔහු තුළ සදාකාල
ජීවනයට උල්පත් වන
ජල උල්පතක් වනු
ඇත.” “ස්වාමිනී මට ඒ
වතුර දෙන්නයැ” යි
කාන්තාව කීවාය.

ජේසුස් වහන්සේ එම කාන්තාවට, ගොස් ඇයගේ ස්වාමිපුරුෂයා කැඳවාගෙන එන ලෙස ඉල්ලා සිටිසේක. “මට ස්වාමි පුරුෂයෙක් නැත” කාන්තාව පිළිතුරු දුන්නාය. “ඔබට ස්වාමි පුරුෂයන් පස්දෙනෙක් සිටියෝය. ඒ වගේම දැන් ඔබට ඉන්නා කෙනා ඔබගේ ස්වාමි පුරුෂයා නොවේයැ” යි ජේසුස් වහන්සේ කී සේක.



ජේසුස් වහන්සේ අනාගතවක්තෘවරයෙකු බව කාන්තාව හඳුනා ගත්තාය. දෙවියන් වහන්සේට නමස්කාර කළ යුත්තේ කොතැනද? ජෙරුසලම හෝ සමාරිතයන්ගේ ශුද්ධ කන්දේද? යන්න ගැන තර්ක කිරීමට ඇය උත්සාහ කළාය. සැබෑ ලෙස නමස්කාර කරන්නන් ආත්මයෙන් හා සත්යතාවයෙන් පියාණන් වහන්සේට නමස්කාර කරන බව ජේසුස් වහන්සේ කීසේක.



“මෙසියස් වහන්සේ එන බව මම දනිමි” යි ඒ ස්ත්‍රිය ජේසුස් වහන්සේට කීවාය. “උන්වහන්සේ පැමිණි විට, උන්වහන්සේ සියල්ල අපට කියනු ඇත.” “ඔබට කතා කරන මම උන්වහන්සේයැ” යි ජේසුස් වහන්සේ ඇයට කීසේක. එවිටම ගෝලයෝ ආපසු ආවෝය. කාන්තාව තම වටිනා වතුර කළය ඒ ළිඳ අසල තබා ආපසු නගරයට පැමිණියාය.





“ඇවිත්, මා විසින් කරන ලද සියල්ල මට කී මනුෂ්යයෙක් බලන්නැ” යි ඒ ස්ත්රිය සිකාර්හි මිනිසුන්ට කීවාය. “මේ ක්රිස්තුස් විය හැකිද?” ඒ මිනිස්සු ජේසුස් වහන්සේ දකිනු පිණිස නුවරින් පිටත් වූවෝය.

මේ අතර ගෝලයෝ ජේසුස් වහන්සේට කෑම ගන්නා මෙන් කීවෝය. නමුත් ජේසුස් වහන්සේ, “මාගේ ආහාරය නම් මා එවූ තැනැත්තාගේ කැමැත්ත කිරීම සහ ඔහුගේ කාර්යය අවසන් කිරීමයැ” යි කීසේක. උන්වහන්සේගේ කාර්යය වූයේ මිනිසුන් දෙවියන් වහන්සේ වෙතට ගෙන ඒමය.



ස්ත්‍රියගේ වචනය නිසා බොහෝ සමාරීයයන් උන් වහන්සේ අදහාගත්තෝය. ඔවුන් ජේසුස් වහන්සේගෙන් ඉල්ලා සිටියේ තමන් සමඟ සිටින ලෙසය. උන්වහන්සේ එහි දින දෙකක්



නැවතී සිටි සේක. ජේසුස් වහන්සේගේම වචන නිසා තවත් බොහෝ දෙනෙක් විශ්වාස කළෝය. “අපිම අසා දැනගත්තෙමු, මේ සැබවින්ම ලෝකයේ ගැළවුම්කරු වන ක්‍රිස්තුස් බව දැන් දනිමු” යි ඔවුහු කීවෝය.

ළිඳ ළඟ වුන් කාන්තාව

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. ජොහාන් 4

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)